# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2016 ඔක්තෝම්බර්

### ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

### ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

ජාතික පාරිභෝගික මිල දර්ශකය නිවේදනය කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය අමර සතරසිංහ මහතා 2016 ඔක්තෝම්බර් මාසයේ වාර්ෂික උද්ධමනය 5.0%ක් ලෙස ගණනය කර ඇති බව ප්‍රකාශ කලේය. 2016 සැප්තැම්බර් මාසයේ උද්ධමනය 4.7%ක් විය. 2015 සැප්තැම්බර් මාසය හා සැසඳීමේදී 2016 ඔක්තෝම්බර් මාසයේ ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම 2.3%කින්ද, ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම 2.8%කින්ද පිළිවෙලින් වැඩිවී ඇත.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 2016 ඔක්තෝම්බර් මස ජාතික පාරිභෝගික මිල දර්ශකය 114.7 ලෙස ප්‍රකාශයට පත් කර ඇත. ඔක්තෝම්බර් මාසයේ දර්ශකය සැප්තැම්බර් මාසයේ දර්ශකය (113.5) හා සංසන්දනය කල විට 1.2ක දර්ශකාංක වැඩිවීමක් හා ප්‍රතිශතයක් ලෙස 1.1ක වැඩිවීමක් වාර්තා වේ. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.79%කින් වැඩිවීම හා ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.22%කින් වැඩිවීම බලපා ඇත.

2016 සැප්තැම්බර් මාසය හා සසඳන කල 2016 ඔක්තෝම්බර් මාසය සඳහා ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.79%ක වැඩිවීමක් දක්නට ඇත. මෙම වැඩිවීම සඳහා සහල්, පොල්, දෙහි, එළවළු, කරවල, පොල්තෙල්, අන්නාසි, කෙසෙල්, සීනි, මයිසූර් පරිප්පු, රතුළූණු, සුදුළූණු, තිරිඟු පිටි සහ කුකුල් මස් යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීම බලපා ඇත. එසේ වුවත් පැපොල්, අඹ, අළුත් මාළු, බිත්තර, අමු මිරිස්, අර්තාපල් සහ ලොකුළූණු යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීමක් වාර්තා වී ඇත.

2016 සැප්තැම්බර් මාසය හා සසඳන කල 2016 ඔක්තෝම්බර් මාසය සඳහා ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.22%ක වැඩිවීමක් දක්නට ඇත. මෙම ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය', 'විවිධ භාණ්ඩ හා සේවා' සහ 'විනෝදාත්මක හා සංස්කෘතික' යන කාණ්ඩවල වියදම්වල වටිනාකම වැඩිවීම බලපා ඇත. 'රෙදිපිළි හා පාවහන්', 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු' සහ 'ආපනශාලා හා හෝටල්' යන කාණ්ඩවල පසුගිය සැප්තැම්බර් මාසය හා සසඳන කල ඉතා සුළු වැඩිවීමක් වාර්තා වී ඇත. 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන', 'සෞඛ්‍ය', 'ප්‍රවාහන', 'සන්නිවේදන' සහ 'අධ්‍යාපන' යන කාණ්ඩවල වියදම්වල වටිනාකම නොවෙනස්ව පැවතුණි. 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා 2016 ඔක්තෝම්බර් මස සිට දුම්කොළ නිෂ්පාදනවල මිල වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත.




**ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)**

| වර්ෂය | මාසය | මිල දර්ශකය | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | වාර්ෂික උද්ධමනය (%) |
|---|---|---|---|---|
| **2015** | ඔක්තෝම්බර් | 109.2 | 0.7 | 3.0 |
| | නොවැම්බර් | 112.0 | 2.6 | 4.8 |
| | දෙසැම්බර් | 113.2 | 1.1 | 4.2 |
| **2016** | ජනවාරි | 112.0 | -1.1 | -0.7 |
| | පෙබරවාරි | 110.8 | -1.1 | 1.7 |
| | මාර්තු | 110.0 | -0.7 | 2.2 |
| | අප්‍රේල් | 111.6 | 1.5 | 4.3 |
| | මැයි | 113.7 | 1.9 | 5.3 |
| | ජූනි | 116.1 | 2.1 | 6.4 |
| | ජූලි | 115.2 | -0.8 | 5.8 |
| | අගෝස්තු | 113.3 | -1.6 | 4.5 |
| | සැප්තැම්බර් | 113.5 | 0.2 | 4.7 |
| | ඔක්තෝම්බර් | 114.7 | 1.1 | 5.0 |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
දුරකථන අංක: 011-2147001 / 011-2147020